# ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මීනුවන්ගොඩ

# Divisional Secretariat - Minuwangoda

මගේ අංකය - මිනු/06/13/02 දිනය - 2023.01. 03

## සාහිත්‍ය නිර්මාණ පරිවර්තන තරගාවලිය- 2023

ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචි අංකුර සාහිත්‍ය නිර්මාණ පරිවර්තකයින්ගේ දක්ෂතා ඇගයීම වෙනුවෙන් පවත්වනු ලබන තරගාවලියකි. මෙම තරගාවලිය සඳහා අංශ හතරක් යටතේ තරගකරුවන්ට ඉදිරිපත් විය හැකි අතර පහත සඳහන් විශේෂ කරුණු යටතේ ඇගයීම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

පොදු කොන්දේසි -

- සිංහල හා ඉංග්‍රීසි යන භාෂා දෙකෙන් පමණක් මෙම පරිවර්තන නිර්මාණ තරගාවලිය ක්‍රියාත්මක වේ..
- තමා කැමති සිංහල හෝ ඉංග්‍රීසි බසින් ලියවුනු කෙටිකතාවක් හෝ කවියක් පරිවර්තනය කර මෙහි සඳහන් ලිපිනයට තැපැල් මගින් හෝ ගෙනැවිත් බාර දීම සිදු කල හැක.
- මුල් පිටපත අදාල පරිවර්තනය සමග යොමු කල යුතුවේ.ඔබ විසින් පරිවර්තනය කල මුල් පිටපත මුද්‍රණය කල ග්‍රන්ථයකින් ලබා ගත් නිර්මාණයක් විය යුතුවේ.එය මෙතෙක් ඔබ විසින් හෝ වෙනත් පරිවර්තකයෙකු අතින් පරිවර්තනය නොවූ නිර්මාණයක් වීම අනිවාර්ය වේ. සමාජ ජාලා වෙබ් අඩවි වල පල වූ නිර්මාණ මේ සඳහා බාර ගනු නොලැබේ.
- ඔබගේ නිර්මාණය වෙනත් පරිවර්තකයෙකු විසින් සිදු කල පරිවර්තනයක් හෝ එම පරිවර්තනයේ කොටස් ඔබගේ නිර්මාණය තුල තිබෙන බව හෙළි දරව් වුවහොත් එම නිර්මාණය තරගයෙන් ඉවත් කරනු ලැබේ.
- සෑම නිර්මාණයක් ම A4 කඩදාසියේ තනි පැත්තේ යතුරු ලියනය කර හෝ පැහැදිලි අත් අකුරින් ලියා එවීම සිදු කල යුතුවේ.
- මෙහි සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය පුරවා අදාල නිර්මාණය එහි මුල් පිටපත සමග අප වෙත එවිය යුතු වේ.
- තරගාවලියෙන් තෝරා ගන්නා පරිවර්තකයින් සඳහා ප්‍රවීණ සම්පත්දායකයින් යොදා ගනිමින් **විශේෂ එක් දින පුහුණු වැඩමුළුවක්** පවත්වනු ලබන අතර ඒ සඳහා මෙම තරගාවලියෙන් පසුව දැනුවත් කිරීම් සිදු කරනු ලැබේ.
- වයස අවුරුදු 16 ට වැඩි ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් සඳහා මෙම තරගය විවෘත වේ.
- එක් තරගකරුවෙකුට ඕනෑම තරග ශීර්ෂයකට ඉදිරිපත් විය හැකිය.
- ජයග්‍රාහී නිර්මාණ සඳහා ත්‍යාග හා සහතිකපත් හිමි වන අතර මෙයින් තෝරා ගත් තරගකරුවන් **උක්ත එක් දින පුහුණු වැඩමුළුවට සහභාගී වීම අනිවාර්ය වේ.**
- විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.
- ඔබගේ පරිවර්තනය ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,මීනුවන්ගොඩ (දු.ක 077-0299330) යන ලිපිනයට 2023 අප්‍රේල් මස 01 වන දිනට පෙර තැපැල් මගින් හෝ ගෙනැවිත් බාර දිය යුතුවේ

යෝජිත තරග ඉසව්

01. සිංහල - ඉංග්‍රීසි කෙටිකතා පරිවර්තන තරගය

සිංහල බසින් ලියවුනු තමා අභිමත කෙටිකතාවක් ඉංග්‍රීසියට පරිවර්තනය කල යුතුවේ. මුල් පිටපතේ උපරිම පිටු ගණන මුද්‍රිත පිටු 15 කි.

02. සිංහල - ඉංග්‍රීසි කාව්‍ය පරිවර්තන තරගය

සිංහල බසින් ලියවුනු තමා අභිමත කවියක් ඉංග්‍රීසියට පරිවර්තනය කල යුතුවේ. මුල් පිටපතේ උපරිම පිටු ගණන මුද්‍රිත පිටු 03කි.

03. ඉංග්‍රීසි - සිංහල කෙටිකතා පරිවර්තන තරගය

ඉංග්‍රීසි බසින් ලියවුනු තමා අභිමත කෙටිකතාවක් සිංහලට පරිවර්තනය කර එවිය යුතුවේ. මුල් පිටපතේ උපරිම පිටු ගණන මුද්‍රිත පිටු 15 කි.

04. ඉංග්‍රීසි - සිංහල කාව්‍ය පරිවර්තන තරගය

ඉංග්‍රීසි බසින් ලියවුනු තමා අභිමත කාව්‍ය නිර්මාණයක් සිංහලට පරිවර්තනය කර එවිය යුතුවේ. මුල් පිටපතේ උපරිම පිටු ගණන මුද්‍රිත පිටු 03 කි.

---

## ආදර්ශ අයදුම්පත්‍රය
## සාහිත්‍ය නිර්මාණ පරිවර්තන තරගාවලිය - 2023

01.සම්පූර්ණ නම - ....................................................................................................

02.ලිපිනය - ....................................................................................................

03.උපන්දිනය - .......................... වයස - ..............................

04.දුරකතන අංකය - .............................. ප්‍රා.ලේ කොට්ඨාසය - ..........................

05.මුල් නිර්මාණයේ භාෂා මාධ්‍ය - සිංහල / ඉංග්‍රීසි (අනවශ්‍ය වචන කපා හරින්න)

06.තරග ඉසව්ව - .............................................................................

07.නිර්මාණයේ නම - .......................................................................... (මුල් නිර්මාණයේ නම හා එය ලබා ගත් කෘතිය ද සඳහන් කරන්න)

08. පරිවර්තකගේ ප්‍රකාශය -

ඉහත සදහන් තොරතුරු මාගේ දැනුම ප්‍රකාරව සත්‍ය හා නිවැරදි වන අතර මේ සමග අමුණා ඇති පරිවර්තනය මා විසින් සිදු කල බවත් එය වෙනත් අයුරකින් මා විසින් පල කල නොමැති බවත් මෙහි මුල් පිටපත දන්නා තරමින් මීට පෙර පරිවර්තනයකට ලක් කර නොමැති බවත් මෙම තරගය සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසි පිළිගැනීමට එකඟ වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය - ..................

..................................
අයදුම්කරුගේ අත්සන

ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මිනුවන්ගොඩ

යූ.ඩබ්ලිව්.ටී.යූ. රාජකරුණා
ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මිනුවන්ගොඩ.